# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2013/25 – 2017 අප්‍රේල් 06 වැනි බ්‍රහස්පතින්දා – 2017.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගොඩ උඩසියපත්තුව සුළු කොට්ඨාසයේ, ගලහිටියාගම (අ.ග.පි. 60 තුළ) ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක Ma/PLL/2015/154 හා 2015.07.18 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'D' වශයෙන් දක්වා ඇති ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඩී' – කෙන්ට් වත්ත – ප්‍රමාණය: **හෙක්. 0.2655**

උතුරට: අ.ග.පි. 60 හි කැබලි අංක 95 සහ 8; නැගෙනහිරට: මොණරුවිල ගම (අ.ග.පි. 49) සහ අ.ග.පි. 60හි කැබලි අංක 99; දකුණට: අ.ග.පි. 60හි කැබලි අංක 99; බටහිරට: කැබලි අක්ෂර සී සහ අ.ග.පි. 60හි කැබලි අංක 95.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2015/වීඊ/204.
2017 පෙබරවාරි මස 03 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

04 – 576